# 2009 වසරේ පලාපල





ලක්ෂ්මන් අබේකෝන්

## තුලා ලග්නය

තම අදහසට අනුව වැඩ කටයුතු හා ගෙදර දොර කටයුතු සිදුවේ සිතට සැනසීම ගෙන දෙන කාලයකි

රුකීරක්ෂා හා ධනය

ගුරුගේ හා රාහුගේ මහ දශා අතුරු දශා ගතකරන තුලා ලග්නයේ අයට මෙම කාලය ටිකක් කරදර සහිතයි නමුත් අනිකුත් දශා අන්තර් දශා ගතවන අයට සුබ කාලයකි පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් නිතර කරනවානම් තම අදහසට අනුව වැඩ කටයුතු හා ගෙදර දොර කටයුතු සිදුවේ සිතට සැනසීම ගෙන දෙන කාලයකි විශේෂ දියුනුවකට මග පෑදීමටද පුලුවන තම තත්වය ඉහලයයි අලුත් තනතුරු රුකීරක්ෂා ආදිය මේ කාලය අවසන් වීමට පෙර ලැබෙන්නටද පුලුවන තත්වයට සුදුසු තනතුරු ආදිය ලැබේ සිතට නිදහස සැනසීම හා ප්‍රීතිය ඇතිවේ තමා කල සේවයේ රක්ෂාවේ ප්‍රතිපල හෙවත් එකවර ලැබෙන්නට තිබෙන පඩි මුදල් බෝනස් ආදිය ලැබන්නට පුලුවන් කාලයයි පොත් පත් ආදියෙන් නම ප්‍රසිධ වේ

මේ කාලයේදී පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම් තම ආදායම අඩුවෙන බැවින් නය තුරුස් ආදිය ඇතිවීමටද පුලුවන වියදම් අධික කරයි සමහරවිට ස්තානවල හෝ කරගෙන ආ කටයුතුවල වෙනසක් ද ඇතිකල හැක නොතේරුම් කමින් හෝ තමා නොදැනම වැරදි සිදුවේ ධන හානියක්ද ඇතිවන කාලයකි දේපල වලින් ආදායම අඩුවේ නැතිනම් ඒවා ගැන පැටලිලි ඇතිවේ

ගෘහ ජීවිතය

රාහු සිවුවැන්නේ ගමන් කරන මේ කාලයේදී හිතට කරදරද කයට දුක් පීඩාද ඇතිකරයි පවුලේ අයගෙන් ඥාති මිත්‍රාදීන්ගෙන් ඇත්වීමහෝ ඒ අයට අපල ඇතිකරයි වෙහෙස ඇති කරදර කාරී ගමන් යාමට සිදුවේ තිබුන වස්තුව අහිමිවේ ඇතැම්විට සිතට සැක ඇතිව සෑම දෙයක්ම කරන්නට සිදුවේ අවුල් වියවුල් නඩු පැටලිලිහෝ හෘදයේ තද තිගැස්සීම් භය කම්පාවීම් ඇතිකරයි අනතුරු හිරිහැර ආදියට මුහුනදෙන්නට සිදධවිය හැකි කාලයක් නිසා ප්‍රවේසම් විය යුතුය පදිංචිය පිලිබද කරදරද ඇති කලහැක නමුත් උගත් අයගෙන් ඒවා විසදාගැනීමට පහසු උපදේශ හා උපකාර ලැබෙනවා ඇත තදකරදර ඇතිවුවත් ඒවායින් පහසුනේ නිදහස් වීමට අනුන්ගෙන් උපකාරද ලැබේ

ඒ නිසා පවතින අපල වලට නිසි පිලියම් බෝධිපූජා ආදිය නිතර කරනවානම් මේ කාලය වඩාත් සුබදායක එකක් බවට පත්කර ගැනීමට පුලුවන එසේ නම් සුබයි දේපල ගෙවල් ඉඩම් උරුම හිමිකම් ආදිය ලැබෙන කාලයකි සුදුසු වයස නම් විවාහ මංගල්‍ය ආදිය පවා ස්තිර වීමට පුලුවන වෙන කෙනෙක් මහන්සිවී කල වැඩක පල ප්‍රයෝජන නිරායාසයෙන් නෙලාගැනීමට ලැබේ

සෞඛ්‍යය

මවුපිය හෝ වැඩිහිටි ඥාතින්ට යහපත සැලසෙන කාලයකි නමුත් ගමන් බිමන් වලින් කරදර හා අනතුරු ආදියද ඇතිකිරීමට පුලුවන

## වෘෂ්චික ලග්නය

සිතේ සතුටට කරුනු යෙදේ සතුරන්ගෙන් ජය ලැබේ ආදායම වැඩිවේ

රැකීරක්ෂා හා ධනය

රාහුගේ මහ දශා අතුරු දශා ගතකරන වෘශ්චික ලග්නයේ අයට මෙම කාලය සුබ කාලයකි රාහු තුන්වැන්නේ ගමන් කරන මේ කාලයේදී ශරීර සනීපය ඇතිවේ සිතේ සතුටට කරුනු යෙදේ සතුරන්ගෙන් ජය ලැබේ ආදායම වැඩිවේ මිත්‍රයන්ගෙන් උපකාරද සැලකිලිද ලැබේ අත්හැර දමා තිබූ වැඩකටයුතු නැවත අලුත්වීමෙන් දියුනුවද තම බලය වැඩිවීමද අසල්වැසියන්ගෙන් ලගඥාතීන්ගෙන් හා දුරබැහැර සිටින මිත්‍රයන්ගෙන් උපකාර ලැබීමද ප්‍රීතිමත් ගමන් බිමන් නිතර යෙදීමද අමුතුවේ පරන වැඩකටයුතු නැවත පටන් ගැනීමට ඉඩ පහසුකම් ලැබීමද සමාජයෙහි තැනක් ලැබීමද මේකාලයේ සිදුවන්නට පුලුවන

ගෘහ ජීවිතය

නමුත් අනිකුත් දශා අන්තර් දශා ගතවන වෘශ්චික ලග්නයේ අයට ටිකක් කරදර සහිතයි ඒනිසා පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම් මුදල් හිග කාලයකි තිබෙන මුදල්ද නිකරුනේ නාස්තිවේ තත්වය පහල වැටේ දියුනුවටද හාධා අවහිරකම් ඇතිවෙන කාලයකි අනුමානයට කරන කටයුතු වලින් පාඩුද පරාජයද ඇතිවේ තනතුරු වලින් පහලවැටේ ඥතියෙකුගේ නැතිනම් ලගම මිතුරෙකුගේ විවාහයත් හෝ තත්වය උසස් වීමක් සිදුවේ නෑදෑ හිතමිතුරු කෙනෙකුගෙන් ඈත්වීමක් හෝ වියෝවීමක්ද ඇතිකල හැක නමුත් පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම් ප්‍රයෝජන නොලැබෙන දෙයට මහන්සිවෙන කාලයකි සමාජයෙහි තිබුන තත්වය නැතිවේ චෝදනා අපවාද ආදිය විදීමටද සිදුවිය හැක අසල්වැසියන් ගෙන් කරදර මතුවේ ගෙදරට පැමිනෙන විට කිසිම ප්‍රීතියක් ඇති නොවේ ස්තානය හෝ පදිංචිය වෙනස් කිරීමට සිතේ කරන කියන කටයුතුවලින් කරදරද පාඩුද හාධා ප්‍රමාදවීම්ද ඇති කාලයකි නිශ්පල ගමන් නිතර ඇතිවේ අලුත් වැඩ කටයුතු වලට හෝ රුකීරක්ෂාවලට බැදෙන්නට හෝ සිදුවන කරුනු ඇති කරත් නමුත් නරක ප්‍රතිපල වශයෙන් ඉගනීමේ හා රුකිරක්ෂා ආදියේ කටයුතු අතපසුවේ නිතරම වස්තු හංගත්වය නිසා සිතේ ප්‍රීතිය අඩුවේ සිත්තැවුල් දුක් දොම්නස ධන හානි මුදල් හානි ඇතිකරන කාලයකි

සෞඛ්‍යය

කනගාටු සිත් තැවුලු වරින් වර ඇතිවේ කරදර බහුල වේ හදිසි අවාසනාවල් මතුවේ මවුපිය ආදී වැඩිහිටියන්ට අසනීපාදී කරදර ඇතිවෙත් වියදම් අධික වේ දරුශිෂ්‍යාදීන් නිසා හෝ නෑනා මස්සිනාලා නිසාහෝ ඈත ඥාතින් නිසා හෝ කරදර හා පාඩුද එවැනි හිතවත් අයට විපත්තිද ඇතිකරන කාලයකි ශරීර සෞඛ්‍යයට යහපත් නොවේ අසනීපකම් ආදිය වැඩිවීමට පුලුවන ඒ නිසා පවතින අපල වලට නිසි පිලියම් බෝධිපූජා ආදිය නිතර කරනවානම් මේ කාලය වඩාත් සුබදායක එකක් බවට පත්කර ගැනීමට පුලුවන එසේ නම් සුබයි

## ධනු ලග්නය

අලුත් අමුතුදේ ඉගනගැනීමට හෝ දැනගැනීමට ලැබේ

රැකීරක්ෂා හා ධනය

ගුරුගේ මහ දශා අතුරු දශා ගතකරන ධනු ලග්නයේ අයට මෙම කාලය වඩා සුබයිගුරු දෙවැන්නේ ගමන්කරන කාලයේදී මිල මුදල් ලාභ ලැබේ ගරුනම්බු ආදියද ලැබීමට පුලුවන පඩිනඩි හෝ ආදායමද වැඩිවේ ඥානයද වැඩිවේ එනම් අලුත් අමුතුදේ ඉගනගැනීමට හෝ දැනගැනීමට ලැබේ ව්‍යාපාර ආදී කටයුතු වලින්ද ජය හා ලාභ ලැබෙන කාලයකි

නමුත් අනිකුත් දශා අන්තර් දශා ගතවන ධනු ලග්නයේ අයට ටිකක් කරදර සහිතයි ශනි 9 වැන්නේ ගමන්කරන කාලයේදී ස්තාන වෙනස් වීමක් හෝ ගෙදරින් පිටයාමට සිදුවීමක් හෝ කාර්යාලීය වෙනසක් හෝ නිතර නිදාගන්නා තැන වෙනස්වීමක් නියමයි ධන ලාබද ලැබෙන මුත් එය වහා නැතිවේ සතුරන් ඉර්ෂියාකාරයන් ඇතිවේ කරගෙන ආ කටයුතු වලට බාධා ඇතිවේ නඩුහබ වලට පවා පැටලෙන්නට පුලුවන

ගෘහ ජීවිතය

නමුත්පවතිනග්‍රහඅපලවලටසෙත්ශාන්තිබෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම්දිනපතාකෙරීගෙන ආ තමාගේ වැඩ කටයුතු වෙනස්වේ පිනට දහමට අකමැතිවේ නමුත් දේව භක්තිය වැඩිවේ මව්පිය වැඩිහිටියන්ගේ ලෙඩදුක් ආදී කරදර නිසා සිතට දුක් ඇතිවේ සමහරවිටක එවැනි කෙනෙතුට හෝ අන්‍ය හිතවතෙකුට මාරක තරම් අපල ඇතිවිය හැක තිබුන හොද නාමය නැතිවේ වියදම් අධික වේ වැඩිහිටියන් ඥාතීන් සමග කරන කටයුතුවලදී නොතේරුම් කමින් හෝ වැරදීම් ඇතිවීමෙන් හෝ අලාබහානි කරදර පාඩු සිත්තැවුලු ආදිය විදීමට සිදුවේ දුර ගමන් යාමට සිදුවේ ප්‍රයෝජනයක් නැති දෙයට උත්සාහ කරන්ටත් වියදම් කරන්නටත් සිද්වේ නොයෙකුත් ක්‍රම වලින් කරදර ඇතිවේ අකරුනාවන්ත කටයුතු අකෘතඥ වැඩ තමා අතින් කෙරෙන සිතෙන කාලයකි ඒ නිසා පවතින අපල වලට නිසි පිලියම් බෝධිපූජා ආදිය නිතර කරනවානම් මේ කාලය වඩාත් සුබදායක එකක් බවට පත්කර ගැනීමට පුලුවන එසේ නම් සුබයි සැපවත් කාලයකි රසවත් කෑමබීම සංග්‍රහ ආදිය ලැබෙන්නට පුලුවන වාසනාව මතුවේ උත්සව පවත්වන්නට සිදුවේ නැතහොත් උත්සව වලට සහභාගිවීමට ඉඩලැබේ ඥාති මිත්‍රයෝද මේකාලයට තමා සොයාගෙන එති ශුද්ධ භූමි වලට යාමටද ඉඩප්‍රස්තා ලැබේ වටිනා දේ මිලට ගැනීමට ලැබේ පවුලේ පිරිස වැඩිවේ නැතිනම් දරු උපත් ආදිය ඇති කාලයකි ගෙදරදොර වාසනාව හා විවාහ මංගල්‍ය ආදියද ප්‍රිය සමාගමීද ඇතිවේ සම්ති සමාගම් වල තනතුරු හෝ කථා පැවැත්වීම් ආදියටද ආරාධනාවන් ලැබෙන්නට ඉඩ ඇත

සෞඛ්‍යය

තම පවුලේ අයට අසනීප හා කරදරද ශාරීරික උත්සාහය හා උනන්දුව හීනවී යාමද කරගෙන ආ කටයුතු වෙනස්වීමද ශරීරයේ ලේ හිගවීම නැතහොත් ලේ නරක්වීමෙන් සෑදෙන රෝග ඇතිවිමද උල් ආයුද වලින් තුවාල හෝ ශල්‍යකරම ආදිය ඇතිවීමද වැනි අපල ඇතිකිරීමට ඉඩ ඇත

## මකර ලග්නය

පදිංචි ස්තානය වෙනස් විය හැකියි

රුකීරක්ෂා හා ධනය

අශ්ටම ඒරාශ්ටක අපල සහිත කාලයකි නොයෙකුත් ක්‍රම වලින් සිත් කරදර කනගාටු ඇතිවේ නුවමනා හිරිහැර වලට අසුවේ ක්‍රමානුකුල ජීවිතයක් ගෙනයාමට නොලැබේ හදිසි අනතුරු හා විපත්ති සහිත හෝ අවනම්බුව ලැබෙන කාලයකි තත්වය පහල වැටේ ගෞරවය නැතිවේ භයෙන් කාලය ගතවේ ආශ්‍රය කරන්නන්ගෙන් බරපතල ලෙස කරදර සිත්තැවුල් ඉර්ෂියාකාර කම් හෝ තම කටයුතු වලට හාධාකිරීම් ඇතිවිය හැක පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම් මේ කාලය වියදම් අධික කරයි දුර බැහැර ගමනක් යාමට සිදුවේ තද සිත්තැවුලක්ද ඇතිවේ ස්තාන මාරුවීමකටද බොහෝ සෙයින් ඉඩ තිබේ එය රක්ෂාව පිලිබද වීමට හෝ පදිංචිය පිලිබදව වීමටද හේතුයි නමුත් මේ කාලසීමාව තුල උසස්වීමක් නම් ඇති නොවේ උසස් අය සමග ආරවුල් හෝ උසස් අය තමා ගැන අප්‍රසන්න වීමට හෝ හේතු තිබෙන බැවින් ඉතා පරිස්සමෙන් හා නුවනින් යුතුව ක්‍රියා කල යුතු ජීවිතයේ එක් අවාසනාවන්ත අමුතුම කාල පරිච්ජේදයකි ඒ නිසා පවතින අපල වලට නිසි පිලියම් බෝධිපූජා ආදිය නිතර කරනවානම් මේ කාලය වඩාත් සුබදායක එකක් බවට පත්කර ගැනීමට පුලුවන එසේ නම් සුබයි

ගෘහ ජීවිතය

පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම්මේකාලයේදී තමාගේ නම නරක් වීමටද හේතුයි නින්දා අපවාද පරාජය ඇතිවේ හිතේ තිබුන ප්‍රීතිය සමාදානය නැතිවීමට පුලුවන නොයෙකුත් ක්‍රම වලින් එකපිට කරදර වැඩිවේ ගෙදරදොර කරදර හා පවුලේ අයගෙන්ම තමාට නොගැලපෙන කතාද කටයුතුද ඇතිවන බැවින් ගෙදරදී සාමාන්‍යයෙන් කෙරීගෙන ආ වැඩකටයුතු පිලිවෙල ටික දවසකටවත් නැවතීමට හෝ වෙනස් පිලිවලකට කරන්නට සිදුවේ පවුලේ අයගෙන් හෝ අඹුදරුවන්ගෙන් වෙන්වීමට සිදුවේ වෙහෙසකර ගමන් ඇතිවේ නිතර නිතර අවාසනාවන්තකම් මතුවේ දුක් කනගාටු වරින්වර ඇතිවෙත් ඥාතීන්ට විපත්ති දායකයි ඥිතින් සමග අමනාපකම් මතුවේ නඩු හබ වලට අසුවීමටද ඉඩකඩ ඇත පියාට හෝ පියපක්ෂයේ වැඩිහිටියෙකුට නැතිනම් වැඩිමල් දරුවාට අපල දායක කාලයකි නරක පහත් අයගේ ආශ්‍රය හෝ එවැනි අය ගෙන් තමාට කරදර පාඩු නින්දා ආදිය ඇතිවීමට පුලුවන පදිංචි ස්තානය වෙනස් විය හැකියි

සෞඛ්‍යය

ගුරු ලග්නයේ ගමන්කරන මෙම වසරේදී තමා ආශ්‍රයකල මිතුරෙකුගේ හෝ හිතවතෙකුගේ විපතක් හෝ කරදරයක් ගැන දැනගැනීමට ලැබේ ශනිද 8 වැන්නේ ගමන්කරන නිසා ශරීර පීඩා අසනීප හෘදයාබාධ ලේ දෝෂ අර්ෂස් ආබාධ ලේ හිගවීම ලේ විෂවීම මලපහවීමේ දෝෂ බෝවෙන රෝග ආදී අසනීප සෑදෙන්නට පුලුවන එය සමහරවිට තමාට හෝ තම පවුලේ අයට සෑදෙන්නට ඉඩ තිබේ

## කුම්භ ලග්නය

අනාගත ලාභ බලාපොරොත්තුවෙන් මුදල් වියදම්කර යම් යම් වැඩ කටයුතු කරන්නට සිදුවේ

රැකීරක්ෂා හා ධනය

අනාගත ලාභ බලාපොරොත්තුවෙන් මුදල් වියදම්කර යම් යම් වැඩ කටයුතු කරන්නට සිදුවේ නමුත් ඒවායින් ලාභ ප්‍රයෝජන ලැබෙන්නේ තව වසර දෙකක් පමන ගතවූපසුය මීකාලයේදී ගෙවල් ඉඩම් වලට වියදම් කරන මුදල් පසුවට ප්‍රයෝජන ඇතිකරයි පවුලේ අයගේ හා දූදරුවන්ගේ දියුනුවට මුදල් වියදම් කිරීමටද කටයුතු සැලසේ ඒවායින්ද මතුවට ප්‍රයෝජන ලැබෙනවා ඇත නමුත් පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම්ශනි 7 වැන්නේ ගමන්කරන කාලයේදී කරගෙන යන රුකීරක්ෂාවලට අවහිරකම් හෝ සතුරුකරදර හෝ වැඩ වැඩිකමින් ප්‍රමාදවීම් ආදිය ඇතිකරයි මහජනයා සමග කරන කටයුතුවලදී අවුල් වියවුල් මතුවේ සිතේ සැනසීම අඩු කාලයකි බොරුචෝදනා නඩුහබ හෝ පැමිනිලි ඇතිකරයි නිස්පල ධන හානියකට හේතුයි ආදායම් තත්වය පහල බසී කායික චෛතසික පීඩා ඇතිකරයි හුන් තැනින් ඉවත්වීමට හෝ පහතවැටීමට සිදුවේ තදලෙස සිත් කම්පාවීමට කටයුතු යෙදේ රුකීරක්ෂා වලින් මෙකාලයේදී පහල වැටුනොත් නැවත ඒ තත්වයට නැගීසිටීමට ගන්නා උත්සාහයන්ගේ ප්‍රතිපල හීන වියහැකි නිසා කරන කියන රුකීරක්ෂා කටයුතු ආරක්ෂාකරගැනීමට උත්සාහකලයුතු කාලයකි

ගෘහ ජීවිතය

නමුත් පවතින ග්‍රහ අපල වලටසෙත් ශාන්ති බෝධිපූජා ආදී පිලියම් කලේ නැතිනම්මේ කාලයේද නිතර පාහේ කනගාටු දායක වූද සිත් තැවුල් කරන්නාවූද කටයුතු සිදුවේ ධන හානි වීමට දුපුපත් වීමට ඉඩ තිබේ ෂතුරන් නිසා නිතරම සිතට භය සැක ඇතිකරන කාලයකි නිෂ්පල වූද වියදම් අධික වූද ගමන් බිමන් යාමට සිදුවේ ස්තාන හෝ කටයුතුද වෙනස්විය හැකිය කරගෙන ආ කටයුතු කඩාබිදවැටීමටහෝ ඒවාට හාධා සිදුවීමට හෝ පුලුවන දිගින්දිගට කනගාටු සහ අවාසනාවන්තකම් මතුවේ මිල මුදල් අතින් නිතරම අගහිගකම්ද අධික වියදම්ද ඇතිකරත් දරුශිෂ්‍යයන්ටද අපල කාලයකි තම ශරීර සනීපයද දුර්වල කරයි පවුලෙන් වෙන් වීමටද සිදුවේ දුර බැහැර පලාත්වලට යාමට සිදුවේ ලගම ඥාතියෙකුට හෝ හිතවතෙකුට අපල කාලයකි

ඒ නිසා පවතින අපල වලට නිසි පිලියම් බෝධිපූජා ආදිය නිතර කරනවානම් මේ කාලය වඩාත් සුබදායක එකක් බවට පත්කර ගැනීමට පුලුවන එසේ නම් සුබයි සනීපය ඇතිවේ අසනීප ගති තිබුනේනම් ඒවායින් සුවය ලැබේ නය ගනුදෙනුවලින් වාසි හෝ ලාභ ලැබේ බලාපොරොත්තු ඉෂ්ට වේ ආදායම වැඩිවේ කරන කියන කටයුතු හෝ රුකිරක්ෂාවලින් බලාපොරොත්තු රහිත ලාභ ලැබේ කරදර වලින් නිදහස ලැබේ දියුනුව ඇතිකරන කාලයකි ලාභ ප්‍රයෝජන ලැබෙන කාලයකි දේපල ස්තානලාභ ලැබෙන්නටද ඉඩ ඇත

සෞඛ්‍යය

හිරිවාතාදී ආහාදද ලිංගාහාධ හිරිවාත අජීර්න රෝග වැලදෙන්නට ඉඩ තිබේ ශරීරයේ සෙම් පිත් ආදියෙහි අසමානකම් තුන්දොස් කෝප ඇතිවේ ධන හීනත්වයත් කායික දුර්වලත්වයත් නිසා සිත් සැනසීම අඩුවේ

29 වන පිටුවට

**Lakshman Abeykoon**
**M. Sc.(Agri.) ; Grad. Dip. (Libr.)**
*5/24 Kelvinside Road Noble Park*
*Vic. 3174 - Australia*
**Phone(03) 9548 1613**
http://jyotisha.00it.com